සැ. යු. - (i) 2015.03.27 වැනි දින පළ වූ අංක 1908 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,909 - 2015 අප්‍රේල් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2015.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 172 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 172 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 174 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 181 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අප්‍රේල් මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අප්‍රේල් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 78

MOD/DEF/10/03/RES/47.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2014 දෙසැම්බර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරිණියගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

ෆ්ලයින් ඔෆිසර් දසනායක තෙනැන්නැහැලාගේ මිහිෂාණි නිරෝෂා දසනායක (වී/0526) - වෛද්‍ය ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බී. එම්. යූ. ඩී. බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

04-11

2015 අංක 79

MOD/DEF/10/03/RES/46.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2014 දෙසැම්බර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

ෆ්ලයින් ඔෆිසර් අයේෂ් ප්‍රියනාත් විජිත රුබසිංහ (වී/0532) - වෛද්‍ය ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බී. එම්. යූ. ඩී. බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

04-10

---

2015 අංක 80

MOD/DEF/10/03/RES/45.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2014 දෙසැම්බර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරිණියගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

ෆ්ලයින් ඔෆිසර් මැල්ලවතන්ත්‍රිගේ චතුරිකා පෙරේරා (වී/0561) වෛද්‍ය ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බී. එම්. යූ. ඩී. බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

04-12

---

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/16/2015/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.03.27 වැනි දින සිට 2015.04.10 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.04.17 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, M දරන කොට්ඨාසයේ 491 වෙළුමේ 53 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ ගොඩිගමුවේ පිහිටි "බටදොඹගහවත්ත" නමැති ඉඩමේ අංක P දරන කැබැල්ලට එච්. එච්. මාටින්ස් මානකතැන විසින් 1946.09.04 දින මැන සාදන ලද අංක 393 දරන පිඹුරට ප්‍රකාර මායිම්,<br><br>*උතුර* : දෙවට අඩිපාර සහ ගම්වාසීන්ට අයත් ඉඩම<br>*නැගෙනහිර* : 393හි ලොට් C2 සහ පාරට වෙන් කළ කොටස<br>*දකුණ* : 393 හි ලොට් Q<br>*බටහිර* : දෙවට අඩි පාර<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 36.5 | 01. ජී. ඒ. එච්. විලි ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1948.03.08 දින අංක 353 දරන විකුණුම් ඔප්පුව<br><br>02. එම්. ඩී. සී. සේනාරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1969.05.16 දින අංක 2387 දරන තෑගි ඔප්පුව. |
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, M දරන කොට්ඨාසයේ 491 වෙළුමේ 54 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ ගොඩිගමුවේ පිහිටි "බටදොඹගහවත්ත" නමැති ඉඩමේ අංක Q දරන කැබැල්ලට එච්. එච්. මාටින්ස් මානකතැන විසින් 1946.09.04 දින මැන සාදන ලද අංක 393 දරන පිඹුරට ප්‍රකාර මායිම්,<br><br>*උතුර* : 393හි ලොට් P<br>*නැගෙනහිර* : පාරකට වෙන් කළ කොටස<br>*දකුණ* : 393 හි ලොට් R<br>*බටහිර* : ගම්වාසීන්ට අයත් ටී. පී. අංක 23592හි කොටස<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 36.5 | 01. ජී. ඒ. එච්. විලි ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1948.03.08 දින අංක 353 දරන විකුණුම් ඔප්පුව<br><br>02. එම්. ඩී. සී. සේනාරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1969.05.16 දින අංක 2387 දරන තෑගි ඔප්පුව. |
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, M දරන කොට්ඨාසයේ 491 වෙළුමේ 55 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ ගොඩිගමුවේ පිහිටි "බටදොඹගහවත්ත" නමැති ඉඩමේ අංක R දරන කැබැල්ලට එච්. එච්. මාටින්ස් මානකතැන විසින් 1946.09.04 දින මැන සාදන ලද අංක 393 දරන පිඹුරට ප්‍රකාර මායිම්,<br><br>*උතුර* : 393හි ලොට් Q<br>*නැගෙනහිර* : පාරකට වෙන් කළ කොටස<br>*දකුණ* : 393 හි ලොට් S<br>*බටහිර* : ගම්වාසීන්ට අයත් ටී. පී. අංක 23592හි කොටස<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 36.5 | 01. ජී. ඒ. එච්. විලි ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1948.03.08 දින අංක 353 දරන විකුණුම් ඔප්පුව<br><br>02. එම්. ඩී. සී. සේනාරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1969.05.16 දින අංක 2387 දරන තෑගි ඔප්පුව. |

**වන්දනා ගමන් ආඥාපනත**

පෙරිය පුල්ලුමලේ ජෙබමාල මැණියන්ගේ දේවස්ථානයේ පාගමන සහ වාර්ෂික උත්සවය - 2015

මෙම වර්ෂ සඳහා ඉහත සඳහන් දේවස්ථානයේ උත්සවය 2015.04.24 වැනි දින ආරම්භවන අතර, මැයි මස උත්සවය මැයි 03 වන දින දිව්‍ය පූජාව සමග අවසන් වීමට නියමිතයි. මෙහි විශේෂ වැඩ සටහන් වනුයේ මඩකලපුව පුලියන්තිව් ශාන්ත මාරියා දේවස්ථානයේ සිට ත්‍රිකුණාමලය මාර්ගයේ වෙන්කලඩි හරහා බදුළු මාර්ගය ඔස්සේ පැවැත්වෙන පා ගමනයි. මෙම පා ගමන මැයි මස 01 වැනි දින දා සවස 04.00ට ආරම්භ වීමට නියමිතයි.

1984.07.16 වැනි දින අංක 9886 දරන ආණ්ඩුවේ ගැසට් නිවේදනයේ සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේ උත්සවයේ වන්දනාවට සහභාගිවන සියල්ලගෙත් හා අනෙකුත් සියලු දෙනාගේ අවධානය යොමු කළ යුතු බව සඳහන් කරමි

ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

ඒරාවුර්පත්තු.

04-13

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## විගණකාධිපති දෙපාර්තමේන්තුව

උපකුලපති,
මොරටුව විශ්වවිද්‍යාලය

මොරටුව විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

මොරටුව විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2014 අගෝස්තු 28 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 *තත්ත්වාගණනය කළ මතය*

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම*

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

2.2.2 *ගිණුම්කරණ අඩුපාඩු*

පහත සඳන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) 2013 දෙසැම්බර් මස 31 දිනට ශුද්ධ වටිනාකම ශුන්‍ය අගයක් වන දැනට පාවිච්චි කරනු ලබන පිරිවැය රු. 17,49,081,481ක් වූ වත්කම් නැවත ප්‍රත්‍යගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පුනරාවර්තන වියදම් රු. 4,533,347ක් අදාළ වියදම් ගිණුම්වලට හර කිරීම වෙනුවට අස්පෘශ්‍ය වත්කම් ලෙස ද, ප්‍රාග්ධන වියදම් රු. 598,080ක් පුනරාවර්තන වියදම් ලෙසද මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවති කෙටිකාලීන පාඨමාලා 10ක අවසාන බැර ශේෂය වූ රු. 2,387,776ක් විශ්ව විද්‍යාලයේ ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රමක්ෂය වටිනාකම රු. 1,587,123කින් වැඩියෙන් දැක්වීම නිසා වැයකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වෙන අතර වර්ෂයේ ක්‍රමක්ෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට උපචිත ආරක්ෂක සේවා වියදම් ලෙස රු. 1,672,075ක් වැඩියෙන් වෙන් කර තිබූ බැවින් උපචිත වියදම් හා ආරක්ෂක සේවා වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඊ) නාගරික සංවර්ධන අධිකාරියෙන් රු. 1,400,000ක් ගෙවා කල්බදු ගිවිසුමක් යටතේ අත්පත් කරගෙන තිබූ ඉඩම කල්බදු දේපළ ලෙස ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 791,367ක් වූ පුනරාවර්තන වියදම් අදාළ වියදම් ගිණුම්වලට හර කිරීම වෙනුවට උපකුලපති අරමුදලට හර කර තිබුණි.

2.2.3 *ලැබිය යුතු ගිණුම්*

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම :

(i) 2013 දෙසැම්බර් මස 31 දිනට ගිවිසුම් හා බැඳුම්කර කඩකර තිබූ නිලධාරීන් 32 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 52,909,188ක ගිවිසුම් සහ බැඳුම්කර වන්දි මුදල් අයකරගෙන නොතිබුණි.

(ii) ගිවිසුම් කඩකළ නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,505,921ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට අදාළ නිලධාරීන් විසින් අනුමැතිය දී තිබුණ ද 2013 දෙසැම්බර් මස 31 වන විටත් එම මුදල් අයකර ගෙන නොතිබුණි.

(iii) ගිවිසුම් සහ බැඳුම්කර කඩකිරීමෙන් රු. 14,766,369ක් අයවිය යුතුව ඇති නිලධාරීන් 05 දෙනෙකු සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් සිදුකර නොතිබූ අතර ඒ තුළ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 2,905,870ක් වූ මුදල වසර 10 ඉක්මවා තිබුණි.

(ආ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ගෘහස්ථ ක්‍රීඩාපිටියක් ඉදිකිරීමට වූ එකඟතාව මත විශ්වවිද්‍යාල අරමුදලින් රු. 4,435,700ක් වැයකර ක්‍රීඩාපිටිය ඉදිකිරීම් නිමකර වර්ෂ 06ක් ගතව තිබුණද වැයකළ මුදල් සමාලෝචිත වර්ෂය අවසාන විනවිටත් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

*2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම*

ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා ඇති රු. 1,793,700ක් වූ ලැබිය යුතු මහපොළ හා ශිෂ්‍යාධාර වටිනාකමෙහි කාල විශ්ලේෂණය සහ ශිෂ්‍යයන්ගේ නාම ලේඛනය ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.

2.2.5 *නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම*

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| *නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99 වැනි වගන්තිය | උසස් අධ්‍යාපන ආයතන මගින් කුමන ප්‍රභවයකින් හෝ අත්කරගනු ලැබුවාවූ සියළු මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැරකළ යුතු වුවත් උපාධි ප්‍රදානෝත්සවය සඳහා ශිෂ්‍යයන්ගෙන් ලබාගෙන තිබූ ගාස්තු රු. 4,002,694 සහ යෝග්‍යතා පරීක්ෂණ ආදායම් රු. 2,783,824ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමකින් තොරව ගෙවිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම පැමිණි වේලාව හා පිටවූ වේලාව පැමිණීමේ ලේඛනවල සටහන් කළ යුතු නමුත් අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම අත්සන් කර නොතිබුණි. |

2.2.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99 වැනි වගන්තිය අනුව උසස් අධ්‍යාපන ආයතන මගින් කුමන ප්‍රභවයකින් හෝ උපයනු ලබන සියළුම ආදායම් එම ආයතනයේ අරමුදලට බැර කල යුතු බව නියම කර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ අංක යූජීසී/එෆ්/පීජ්/2002 හා 2003 පෙබරවාරි 24 දිනැති ලිපියෙන් ද මේ සම්බන්ධව අවධානය යොමු කළ යුතු බව සඳහන්ව තිබියදීත් 2013 වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය විසින් උපයන ලද බාහිරි පාඨමාලා ආදායමෙන් රු. 7,170,033ක් හා යෝග්‍යතා පරීක්ෂණ ආදායමෙන් රු. 1,880,579ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සේවකයන් අතර බෙදා දී තිබුණි. මෙසේ ගෙවීම සඳහා උපදේශක සේවා භාර ගැනීම සඳහා වූ රාජ්‍ය මුදල් අංක 380 චක්‍රලේඛය වැරදි සහගත ලෙස අර්ථකථනය කර තිබුණි.

(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අරමුණ වූයේ උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීම හා ඒවා පවත්වාගෙන යාම වුවද එකී පනතට අදාළ නොවන පරිදි හා කැබිනට් අනුමැතියකින් ද තොරව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවත්වා තිබූ පෞද්ගලික සමාගමකට තොරතුරු තාක්ෂණ බාහිර පාඨමාලාවේ (BIT) ආදායමින් රු. 2,613,580ක් කළමනාකරණ ගාස්තු වශයෙන් ගෙවීම් කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 *මූල්‍ය ප්‍රතිඵල*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු වලින් රු. 190,252,999ක ඌනතවයක් ලැබූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 64,407,671ක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදාන රු. 103,772,000 කින් වැඩි වී තිබුණ ද පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 125,845,328 කින් වැඩි වී තිබුණ අතර කාර්ය මණ්ඩල පාරිශ්‍රමික රු. 158,364,163කින් වැඩිවීම, සුභසාධන වියදම් රු. 24,713,733කින් වැඩිවීම සහ ගිවිසුම්ගත සේවා වියදම් රු. 26,360,158කින් වැඩිවීම මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 *කාර්ය සාධනය*

සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍ය තොරතුරු පහත පරිදි විය.

| | ඉංජිනේරු පීඨය | තොරතුරු තාක්ෂණ පීඨය | වාස්තු විද්‍යා පීඨය |
|---|---|---|---|
| ස්ථිර කථිකාචාර්යවරු සංඛ්‍යාව | 253 | 28 | 83 |
| බඳවාගත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | 1005 | 274 | 468 |
| පිටවූ උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | 697 | 67 | 309 |
| රැඳී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 3498 | 720 | 1299 |

(අ) සමාලෝචිත වර්ෂයේ සේවයේ නියුක්තව සිටි ස්ථිර කථිචාර්යවරු සංඛ්‍යාව 364ක් අතර එක් කථිකාචාර්යවරයෙකු සඳහා වූ සාමාන්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව 15ක් විය.

(ආ) සමලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් රු. 1,444,551,340ක් වීම නිසා ඒක ශිෂ්‍ය පිරිවැය රු. 261,836ක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ උපාධි අපේක්ෂකයින් 825කට හා උපාධි අපේක්ෂිකාවන් 230කට නේවාසිකාගාර පහසුකම් සලසා තිබූ අතර නේවාසික වියදම් රු. 5,661,639ක් වී තිබුණි.

4.2 *කළමනාකරණ අකාර්යක්ෂමතා*

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාදය

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1995 ජූලි 14 දිනැති හා අංක 636 දරන චක්‍රලේඛය අනුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විභාගයන් පවත්වා මාස 03ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතු වුව ද, 2012 සහ 2013 වර්ෂවල පැවැත්වූ විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීම මාස 04 සිට 17 දක්වා ද ප්‍රමාද වූ අවස්ථා 73ක් නිරීක්ෂණය විය.

(ii) ඇතැම් උපාධි පාඨමාලාවල පළමු වාරයේ ප්‍රතිඵල නිකුත් කිරීමට ගතකර ඇති කාලය එම පාඨමාලාවල අදාළ සිසුන්ගේ දෙවන වාරයේ විභාගය පැවැත්වූ දිනයෙන් පසු දිනයක් දක්වාම ප්‍රමාද වූ අවස්ථා 17ක් නිරීක්ෂණය කෙරුණි.

(ආ) විශ්වවිද්‍යාල නාගරික සංවර්ධන අධිකාරියෙන් කල්බදු ගිවිසුමක් යටතේ අත්පත් කර තිබූ ඉඩමට අදාළ කල්බදු ගිවිසුමේ වගන්ති ප්‍රකාරව ගිවිසුමට එළඹී දිනයේ එනම් 2009 ඔක්තෝබර් 14 දින සිට වසර 02ක් තුළ එම සංවර්ධන කටයුතු සිදුකර අවසන් කළ යුතුව ඇත. ඒ අනුව එම සංවර්ධන කටයුතු කිරීමට දී ඇති කාලසීමාව 2011 ඔක්තෝබර් 14 දින වන විට ඉකුත්ව තිබෙන අතර එම සංවර්ධන කටයුතු අවසන් කිරීම 2014 ජුනි 11 දින වන විටත් සිදු කර නොතිබුණි.

4.3 *දෘශ්‍ය අක්‍රමිකතා*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ විධිවිධාන වලට අදාල නොවන පරිදි අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙක් වෙනත් රාජ්‍ය ආයතනයක විශේෂඥ උපදේශක තනතුරේ කටයුතු 2011 අප්‍රේල් 01 දින සිට 2014 මාර්තු මාසය දක්වා සිදුකර ඇති අතර එම කාලපරිච්ඡේදය තුළදී එහු එම කටයුතු සිදු කිරීම වෙනුවෙන් රු. 2,770,350ක දීමනාවක් ලබාගෙන තිබුණි. එම කාලපරිච්ඡේදය තුළදී ඔහු මොරටුව විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කිරීම වෙනුවෙන් රු. 3,952,323ක පාරිශ්‍රමිකයක් ලබාගෙන තිබුණි.

4.4 *අරමුදල් ඌන උපයෝජනය*

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මොරටුව විශ්වවිද්‍යාලයට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම වෙනුවෙන් ලද ප්‍රදානවලින් පිහිටුවා ඇති රු. 4,174,191ක් වූ අරමුදල් 25කින් කිසිදු ශිෂ්‍යත්වයක් පසුගිය වසර 05 තුළදී පිරිනැමීමට කටයුතු කර නොතිබුණ අතර රු. 7,566,781ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 37ක් වර්ෂය තුළ ක්‍රියාකාරිත්වයක් දක්නට නොතිබුණි.

(ආ) ප්‍රදාන වශයෙන් ලද රු. 4,887,358ක් වූ අරමුදල් 05ක් ද රු. 3,812,060ක් වූ දෙපාර්තමේන්තු අරමුදල් 17ක් ද රු. 4,556,334ක් වූ පාඨමාලා සංවර්ධන අරමුදල් 12ක් ද සමාලෝචිත වර්ෂය තුළදී අක්‍රියව පැවතුණි.

4.5 *විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්*

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මොරටුව විශ්වවිද්‍යාලයේ පිහිටි අක්කර 55ක පමණ ඉඩම මොරටුව විශ්වවිද්‍යාලයේ නමට, මේ දක්වා පවරාගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලට අයත් දේපළ 05 ක් සම්බන්ධයෙන් පරිපනම් බදු ගෙවීම් කරනු ලබන්නේ පෙර අයිතිකරුගේ නමිනි. අයිතිය වෙනස්වීම පළාත් පාලන ආයතනයට දැනුම් දී මෙම දේපළ විශ්වවිද්‍යාලයට පවරා වරිපනම් බදු ගෙවීම විශ්වවිද්‍යාලය නමින් කළයුතු වූවත්, වර්ෂ කිහිපයක සිටම මෙම කටයුතු සිදුකර නොතිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 31 දිනට විශ්විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 82 ක් ද අනෙකුත් කර්ය මණ්ඩලයේ පුරප්පාඩු 71 ක් ද පැවතුණි.

5. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

5.1 ක්‍රියාකාරී සැලැස්ම

2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වූ පශ්චාත් උපාධි පාඨමාලා 04ක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

6. **පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන සම්බන්ධයෙන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු ය.

(අ) ණය හා අත්තිකාරම් පාලනය
(ආ) පශ්චාත් උපාධි පාඨමාලා ආදයම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) ගිවිසුම් කඩකිරීම
(ඉ) අධ්‍යයන මණ්ඩලයේ පැමිණීම පිටවීම.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න,
විගණකාධිපති (වැඩබලන).

මූල්‍ය ගිණුම් 2013

**2013 දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම වත්කම් | | | |
| තොග | 4 | 5,579,053 | 5,387,970 |
| සේවක ණය සහ අත්තිකාරම් | 5 | 62,991,905 | 64,537,766 |
| ලැබිය යුතු දෑ | 6 | 80,925,823 | 85,889,906 |
| කලින් ගෙවීම් | | 12,930,864 | 14,479,478 |
| බැංකු මුදල් | 7 | 100,186,372 | 68,567,549 |
| අතැති මුදල් | 8 | - | 1,486 |
| | | 262,614,017 | 238,864,154 |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 1 | 2,195,913,161 | 1,944,770,007 |
| වෙනත් ප්‍රාග්ධන ක්‍රියකාරකම් | 1.ඒ | 4,533,348 | - |
| අස්පෘශ්‍ය වත්කම් | | 331,257,614 | 334,592,765 |
| අයෝජන (දී. ගු.) | 2 | | |
| නොනිමි වැඩ | 3 | 193,700,893 | 308,780,609 |
| | | 2,725,405,016 | 2,588,143,381 |
| **මුළු වත්කම්** | | 2,988,019,033 | 2,827,007,535 |
| වගකීම් | | | |
| ජංගම වගකීම් | | | |
| ගෙවිය යුතු තැන්පතු | 9 | 15,148,777 | 14,820,342 |
| පර්යේෂණ ප්‍රදාන | 10 | 11,048,376 | 6,142,614 |

| | සටහන | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| ගෙවිය යුතු දෑ | 11 | 84,761,110 | 56,401,817 |
| උපචිත වියදම් | - | 76,685,779 | 52,724,548 |
| විලම්බිත ආදායම් | 12 | 232,218,920 | 170,635,855 |
| | | 419,862,962 | 300,725,177 |
| ජංගම - නොවන වගකීම් | | | |
| පාරිතෝෂිත වෙන් කිරීම් | | 218,194,334 | 202,232,378 |
| | | 218,194,334 | 202,232,378 |
| මුලු වගකීම් | | 638,057,295 | 502,957,555 |
| ශුද්ධ වත්කම් | | 2,349,961,738 | 2,324,049,981 |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන - වැය කළ | 13 | 1,959,443,145 | 1,817,572,131 |
| ප්‍රාග්ධන ප්‍රාදාන - වැය නොකළ | 14 | 17,053,471 | 48,167,026 |
| උත්පාදිත අරමුදල් ප්‍රාග්ධනය | 15 | 298,973,479 | 275,456,575 |
| පරිත්‍යාග | 16 | 1,066,967,527 | 1,059,786,429 |
| | | 3,342,437,622 | 3,200,983,161 |
| සංචිත | | | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 88,861,613 | 88,861,613 |
| ක්‍රීඩා සංවර්. සංචිත | | 1,073,770 | 985,270 |
| පොදු සංචිතය | | (1,516,347,142) | (1,339,810,352) |
| | | (1,426,411,759) | (1,249,963,460) |
| අරමුදල් | | | |
| සීමාකළ අරමුදල් | 17 | 413,890,572 | 356,440,941 |
| පරිත්‍යාග අරමුදල | 18 | 20,045,303 | 16,589,348 |
| මුළු ශුද්ධ වත්කම්/හිමිකම් | | 2,349,961,738 | 2,324,049,981 |

මහාචාර්ය ඒ. කේ. ඩබ්ලිව්. ජයවර්ධන
උපකුලපති
ගිණුම්කරණ නිලධාරී

ඩබ්ලිව්. එල්. වී. ජයසේන මිය,
වැඩබලන ලේඛාකාධිකාරී,
සහාය ගිණුම්කරණ නිලධාරී

පී. ඒ. ගුණතිලක,
මූල්‍යාධිකාරී.

**2013 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| ආදායම | | | |
| රාජ්‍ය ප්‍රදාන | | 1,045,903,000 | 942,131,000 |
| ශිෂ්‍යාධාර | | 3,921,000 | 3,138,900 |
| මහපොළ | | 7,118,500 | 5,376,500 |
| ප්‍රදාන ශිෂ්‍යත්ව | | 110,400 | 81,900 |
| TIL ප්‍රදාන වලින් ලැබීම් | | - | 3.073,744 |
| පිරිවැය ප්‍රතිසාධන ක්‍රියාකාරකම් වලින් ලැබීම් | | 425,648,151 | 241,197,682 |
| ලද පොලී | 19 | 23,285,485 | 17,738,693 |
| ශිෂ්‍යයන්ගෙන් ආදායම් | 20 | 4,000,340 | 2,697,305 |
| වෙනත් ආදායම් | 21 | 6,800,969 | 4,904,793 |
| පර්යේෂණ සඳහා ප්‍රදාන ලැබීම් | | 1,381,001 | 7,441,909 |
| ක්‍රමක්ෂය | | 162,820,199 | 155,041,345 |
| නේවාසිකාගාර අතිරික්තය | | 338,448 | - |

අඩුකළා :

| | සටහන | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| ව්‍යාපෘති ගිණුම් වෙත මාරු කළ පර්යේෂණ | | (1,381,001) | 7,441,909 |
| **මුළු ආදායම** | | 1,679,946,492 | 1,375,381,862 |
| වියදම් | | | |
| පුද්ගල සංවේතන | 22 | (845,522,172) | (687,158,009) |
| ගමන් සහ යැපීම් වියදම් | 23 | (5,729,582) | (3,903,304) |
| සුබසාධන සේවා | 24 | (46,459,648) | (21,745,915) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 25 | (44,959,393) | (29,141,328) |
| ශිෂ්‍යයන් වෙත මූල්‍ය සහාය | 26 | (11,149,900) | (8,957,300) |
| **උප එකතුව** | | **(953,820,695)** | **(750,905,856)** |
| ගිවිසුම් ගත සේවා | 27 | (166,888,502) | (140,528,344) |
| සැපයුම් සහ පරිභෝජන | 28 | (86,487,877) | (71,172,266) |
| අධ්‍යයන පර්යේෂණ | | (12,913,334) | (10,007,107) |
| නඩත්තු | 29 | (29,232,990) | (24,296,912) |
| TIL ප්‍රදාන වියදම් (අධිශිෂ්‍යත්ව) | | - | 3,073,744 |
| පිරිවැය ප්‍රතිසාධන ක්‍රියාකාරකම් මත වියදම් | | (425,648,151) | (241,197,682) |
| ක්ෂය | | (194,722,258) | (198,279,181) |
| මූල්‍ය පිරිවැය | 30 | (485,683) | 328,440 |
| උප එකතුව | | (916,378,796) | (688,883,676) |
| මුළු වියදම | | (1,870,199,491) | (1,439,789,533) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය) | | (190,252,999) | (64,407,671) |

මහාචාර්ය ඒ. කේ. ඩබ්ලිව්. ජයවර්ධන
උපකුලපති
ගිණුම්කරණ නිලධාරී

ඩබ්ලිව්. එල්. වී. ජයසේන මිය,
වැඩබලන ලේඛකාධිකාරී,
සහායක ගිණුම්කරණ නිලධාරී

පී. ඒ. ගුණතිලක,
මූල්‍යාධිකාරී.

**2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය/(හිඟය) | | (190,252,999) | (64,407,671) |
| පිරිවැය ප්‍රතිසාධන ක්‍රියාමාර්ගවල හිඟයෙහි අඩුවීම | - | - | - |
| | | (190,252,999) | (64,407,671) |
| ගැළපුම් | | | |
| බැර ගැළපුම් (ලැයිස්. 9+10) | | 16,203,528 | 22,234,295 |
| හර ගැළපුම් (ලැයිස්. 11+12) | | (66,894,994) | (168,489,708) |
| ක්‍රීඩා ක්‍රියාකාරකම් | 17 | (88,500) | (147,278) |
| ලද පොලී | 19 | (23,285,485) | 17,378,693 |
| වත්කම් ගැළපුම් | | (12,635,282) | (6,378,212) |
| ක්ෂය ගැළපුම් | | 12,565,992 | 6,286,444 |
| බැංකු ගාස්තු | 30 | 485,683 | 328,440 |
| | | (73,649,058) | (163,544,712) |
| මුදල් නොවන චලනයන් | | | |
| ක්ෂය | 1 | 194,722,258 | 198,279,181 |
| පාරිතෝෂිත වෙන් කිරීම් | | 27,894,183 | 18,135,496 |
| ක්‍රමක්ෂය | 1 | (162,820,199) | (155,041,345) |

| | | සටහන | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|---|
| | | | 59,796,242 | 61,373,332 |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය/(හිඟය) | | | (204,105,815) | (166,579,052) |
| **කාරක ප්‍රාග්ධනයේ වැඩිවීම/අඩුවීම** | | | | |
| ජංගම වත්කම්වල වැඩිවීම | 7,867,475 | | | |
| ජංගම වගකීම්වල වැඩිවීම | 135,099,741 | | 142,967,216 | 58,681,088 |
| සේවක ණය සහ අත්තිකාරම්වලින් පොලී | | 19 | 2,918,184 | 3,345,657 |
| | | | 145,885,400 | 62,026,745 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය | | | (58,220,415) | (104,552,306) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | |
| පිරියත සහ උපකරණ මිලදී ගැනීම | | 1 | (236,753,966) | (246,160,311) |
| ඉදි කිරීම සඳහා ගෙවීම් | | 3 | (67,936,367) | 88,081,001 |
| පැරණි තොග අලෙවියෙන් ප්‍රේෂණ | | | 849,270 | 655,473 |
| පරිත්‍යාග අරමුදල සඳහා ලද බැංකු පොලී | | 18 | 1,536,239 | 1,448,087 |
| ආයෝජන වලින් පොලිය | | 19 | 20,367,301 | 14,033,035 |
| | | | (281,937,521) | (318,104,717) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය | | | (340,157,936) | (422,657,024) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | |
| භාණ්ඩාගාරයෙන් ප්‍රදාන | | 14 | 261,770,00 | 169,165,061 |
| UGC වෙතින් IT සහ SDC ප්‍රදාන | | 14 | 4,500,000 | 1,000,000 |
| UGC වෙතින් SLUG ප්‍රදාන | | 14 | - | 30,000,000 |
| වෙනත් ප්‍රාග්ධන ලැබීම් | | 14 | 12,233,048 | 32,104,719 |
| වාහන සඳහා ලැබීම් | | 14 | - | 2,750,000 |
| පර්යේෂණ ප්‍රදාන - ජාතික විද්‍යා පදනම | | 14 | 1,381,001 | 7,441,909 |
| උත්පාදිත ආදායම | | 15 | 23,516,903 | 7,589,256 |
| ලද පරිත්‍යාග | | 16 | 6,088,790 | 87,523,512 |
| වෙනත් පරිත්‍යාග | | | - | 75,000 |
| පරිත්‍යාග අරමුදල වෙතින් තිලිණ ගෙවීම් | | 18 | (1,330,455) | (372,583) |
| පරිත්‍යාග අරමුදලට ප්‍රේෂණ | | 18 | 3,250,171 | - |
| අවහිර කළ අරමුදලේ වැඩිවීම | | | 57,449,631 | 21,834,954 |
| ගෙවූ බැංකු ගාස්තු | | 30 | (485,683) | 328,440 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | 368,373,407 | 358,783,658 |
| මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | | 28,318,284 | (63,873,365) |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | | 31 | 403,125,702 | 466,999,067 |
| කාල රිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | | 31 | 431,443,986 | 403,125,702 |

04 - 14

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2015ක් වූ පෙබරවාරි මස 13 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

"නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් ගම්පොළ ප්‍රසිද්ධ නොතාරිස් දිල්මිණි ආර්. කේ. සමරතුංග (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.06.11 දිනැති අංක 1233 සහ වර්ෂ 2013.10.30 දිනැති අංක 1307 දරන උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිය ලියාපදිංචි කාර්යාලය ගම්පොල පිහිටි 1990.10.01 දිනැති සහතික අංක MAPASA/UPA/42 දරන සහතිකය යටතේ ලියාපදිංචි වී ඇති අරවින්ද වෙළඳ සංගමය යන නාමය සහ විලාසය සහ ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාර කටයුතු වල යෙදෙන ගම්පොළ, ඇත්ගාලේ පදිංචි මුදුන්කොටුවේගෙදර ටිෂාන් එරංග ගුණතිලක, මුදුන්කොටුවේගෙදර සුසිල් ප්‍රේමපුෂ්ප ගුණතිලක සහ රත්නායක

මුදියන්සේලාගේ නන්දා ගුණතිලක යන අය විසින් (ණයට ගන්නන්) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තවද ණයට ගන්නන් විසින් ඉහත කී අංක 1233 සහ අංක 1307 දරන බැඳුම්කරයන් යටතේ මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති චංචල දේපල බැංකුවට අකස් කර ඇති හෙයින් ද,

තවද වර්ෂ 2014 දෙසැම්බර් මස 31 වැනි දිනට යථෝක්ත බැඳුම්කරයන් යටතේ බැංකුවට රුපියල් එක් මිලියන අටලක්ෂ හත් දහස් අටසිය හතලිස් තුනයි ශත අනූ තුන (රු. 18,07,843.93) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින් බැවින් ද,

සංශෝධනය කරන ලද 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතල වලට අනුව එකී රුපියල් එක් මිලියන අට ලක්ෂ හත් දහස් අටසිය හතලිස් තුනයි ශත අනූ තුන (රු. 18,07,843.93)ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2015 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකි අංක 1233 සහ අංක 1307 දරන බැඳුම්කරයන් මගින් සුරැකුම් කරන ලද සහ එකී අංක 1233 සහ අංක 1307 දරන බැඳුම්කරයන් යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් එක් මිලියන හාරලක්ෂ හැටපන් දහස් හයසිය විසි පහයි ශත අනූ නවය (රු. 14,65,625.99) ක මුදල මත වසරකට සියයට විසි එකක (21%) පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද, ප්‍රධාන පනතේ 4 වන වගන්තිය අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් ඒවාද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී අංක 1233 සහ අංක 1307 දරන බැඳුම්කරන් යටතේ බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති චංචල දේපල බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතල වලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ. "

### ඉහත සඳහන් උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොළ, අඹගමුව පාරේ, අංක 230 සහ ගම්පොළ දුම්රිය පාරේ අංක 47 දරන ස්ථානයේ වූ ශ්‍රී ලංකා ස්ටෝර්ස් තුළ තබා ඇති හෝ ගබඩා කර ඇති ප්‍රීමා තිරිඟු පිටි තොග සහ වෙනත් වියළි ද්‍රව්‍ය, ග්‍රෝසරි සහ සිල්ලර උපකරණ සහ සෑම සහ සියළු තොග, වෙළඳ තොග, වෙළඳ භාණ්ඩ සහ නිමි භාණ්ඩ සහ වෙනත් සෑම ආකාරයකම චංචල දේපල සහ ණයට ගන්නන් විසින් කලින් කල ගෙනෙනු ලබන හෝ ඉහත කී පරිශ්‍රය මත ගබඩා කර ඇති හෝ තබා ඇති සෑම ආකාරයකම වෙළඳ තොග මෙන්ම ණයට ගන්නන් විසින් වෙළඳ කටයුතු පවත්වාගෙන යන වෙනත් ස්ථානයක තබා ඇති සවිකර ඇති ගබඩා කර ඇති සෑම ආකාරයකම වෙළඳ තොග වේ. මෙය ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ STR2/211 සා වං. 21/129 සහ STR2/212 සා වං. 22/22 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

04-101/1

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2015ක් වූ පෙබරවාරි මස 13 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

"නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් ගම්පොළ ප්‍රසිද්ධ නොතාරිස් දිල්මිණි ආර්. කේ. සමරතුංග (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.06.11 දිනැති අංක 1231, වර්ෂ 2013.10.30 දිනැති අංක 1303 සහ 1305 දරන උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිය ලියාපදිංචි කාර්යාලය ගම්පොළ පිහිටි 1990.10.01 දිනැති සහතික අංක MAPASA/UPA/42 දරන සහතිකය යටතේ ලියාපදිංචි වී ඇති අරවින්ද වෙළඳ සංගමය යන නාමය විලාසය සහ ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාර කටයුතු වල යෙදෙන ගම්පොළ, ඇත්ගාලේ පදිංචි මුදුන්කොටුවේගෙදර ටිෂාන් එරංග ගුණතිලක, මුදුන්කොටුවේගෙදර සුසිල් ප්‍රේමපුෂ්ප ගුණතිලක සහ රත්නායක මුදියන්සේලාගේ නන්දා ගුණතිලක යන අය විසින් (ණයට ගන්නන්) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තවද ඉහත හවුල් ව්‍යාපාරයේ කළමණාකාර අධ්‍යක්ෂ වන මුදුන්කොටුවේගෙදර ටිෂාන් එරංග ගුණතිලක විසින් මෙහි පහත උපලේඛනයේ පළවන කොටසේ සඳහන් දේපළ සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම් හිමිකම් සහ බලපුළුවන්කාරකම් ඉහත කී අංක 1231 සහ අංක 1303 දරන බැඳුම්කරයන් යටතේ ද, මෙහි පහත උපලේඛනයේ දෙවන කොටසේ සඳහන් දේපළ සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම් හිමිකම් සහ බලපුළුවන්කාරකම් එකී අංක 1303 දරන බැඳුම්කරය යටතේ බැංකුවට උකස් කර ඇති හෙයින් ද,

තවද ඉහත හවුල් ව්‍යාපාරයේ කළමණාකාර අධ්‍යක්ෂ වන මුදුන්කොටුවේගෙදර ටිෂාන් එරංග ගුණතිලක විසින් මෙහි පහත උපලේඛනයේ තුන්වන කොටසේ සඳහන් දේපළ සහ පරිශ්‍රය සඳහා වන සියබදු අයිතිවාසිකම් හිමිකම් සහ බලපුළුවන්කාරකම් ඉහත කී අංක 1231 සහ අංක 1305 දරන බැඳුම්කරයන් යටතේ බැංකුව උකස් කර ඇති හෙයින් ද,

තවද වර්ෂ 2014 දෙසැම්බර් මස 31 වැනි දිනට යථෝක්ත බැඳුම්කරයන් යටතේ බැංකුවට රුපියල් දහසය මිලියන දෙලක්ෂ හැත්තෑ දහස් පන්සිය අනූ පහයි ශත තිස් තුන (රු. 16,270,595.33) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින් බැවින් ද,

සංශෝධනය කරන ලද 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතල වලට අනුව එකී රුපියල් දහසය මිලියන දෙලක්ෂ හැත්තෑ දහස් පන්සිය අනූ පහයි ශත තිස් තුන (රු. 16,270,595.33)ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2015 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා

(i) එකී අංක 1231 සහ අංක 1303 දරන බැඳුම්කරයන් මගින් සුරැකුම් කරන ලද සහ එකී අංක 1231 සහ අංක 1303 දරන බැඳුම්කරයන් යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් දස මිලියන හත් ලක්ෂ හතලිස් හත් දහස් නවසිය විසි තුනයි ශත අනූව (රු. 10,747,923.90) ක මුදල මත වසරකට සියයට විසි එකක (21%) පොළිය ද,

(ii) එකී අංක 1305 දරන බැඳුම්කරය සුරැකුම් කරන ලද එකී අංක 1305 දරන බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් දෙමිලියන හාර ලක්ෂ හතලිස් දෙදහස් හත්සිය නවයයි ශත අනූ අට (රු. 2,442,709.98) ක මුදල මත වසරකට සියයට විසි එකක (21%) පොලිය ද,

ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද, ප්‍රධාන පනතේ 4 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එයද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී අංක 1231 සහ අංක 1303 දරන බැඳුම්කරයන් යටතේ බැංකුවට උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ පළවන සහ දෙවන කොටස්වල විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය සඳහා වන නිදහස් අයිතිවාසිකම් හිමිකම් සහ බලපුළුවන්කාරකම් සහ එකී අංක 1231 සහ අංක 1305 දරන බැඳුම්කරයන් යටතේ බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ තුන්වන කොටසේ විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය සඳහා වන බදු අයිතිවාසිකම් හිමිකම් සහ බලපුළුවන්කාරකම් බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතල වලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.”

**ඉහත සඳහන් උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

*පළමුවන කොටස :*

1. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ උඩපළාත කෝරළේ, වැලිමඩ සහ කැප්පෙටිපොල ප්‍රාදේශීය අධිකාරී ප්‍රදේශයේ කොට්ඨාස ලේකම් කාර්යාලය තුළ පිහිටි ගවරම්මාන ගමෙහි වූ ගවරම්මාන අංක 49 ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසය තුළ පිහිටි නිලල්ලේවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බයලත් මානක එස්. පී. රත්නායක විසින් සාදන ලද 2008.08.18 දිනැති හා අංක 3533/A දරන පිඹුරෙහි ලොට් 1D ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස එකී අංක 3533/A දරන පිඹුර ප්‍රකාරව උතුරට : අයි. එම්. එම්. ගුණතිලක සහ වෙනත් අයට අයත් යැයි කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : ඉඩම් සංවර්ධන අධිකාරියේ ඉඩමෙන් ද, දකුණට : ඉහත කී පිඹුරේ ලොට 2D වලින් ද සහ බටහිරට : ප්‍රාදේශීය සභා පාරෙන් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි දෙකයි දශම හත (අ. 0, රූ. 1, පර්. 22.7)ක් වන අතර එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් ඇතුළු සියළු දේද සමග වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N15/09 හි ලියාපදිංචි වී ඇත.

2. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ උඩපළාත කෝරළේ වැලිමඩ සහ කැප්පෙටිපොල ප්‍රාදේශීය අධිකාරී ප්‍රදේශයේ කොට්ඨාස ලේකම් කාර්යාලය තුළ පිහිටි ගවරම්මාන ගමෙහි වූ ගවරම්මාන අංක 49 ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසය තුළ පිහිටි නිලල්ලේවත්ත සහ නිලල්ලේහේන යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක එස්. පී. රත්නායක විසින් 2012.03.09 වැනි දින සාදන ලද සහ 2011.08.18 දින මනින ලද අංක 3533/B දරන පිඹුරෙහි ලොට් 1 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස එකී අංක 3533/B දරන පිඹුර ප්‍රකාරව උතුරට : අයි. එම්. ගුණතිලක සහ වෙනත් අයට අයත් යැයි කියන ඉඩමෙන් සහ වැවෙන් ද, නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාරෙන් ද, දකුණට : බලයලත් මානක එස්. පී. රත්නායක විසින් සාදන ලද ඉහත කී අංක 3533/A දරන පිඹුරෙහි ලොට් 2C සහ 2B වලින් ද, බටහිරට : කඳුර හෙවත් වඩාත් නිවැරදි ලෙස ඇලෙන් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් නවයයි දශම හතර (අ. 02, රූ. 02, පර්. 9.4)ක් වන අතර එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් ඇතුළු සියලු දේද සමග වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 15/07හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී ඉඩම පහත සඳහන් වන ඉඩම් වල ඒකාබද්ධ කිරීමක් වේ :-

(අ) ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ උඩපළාත කෝරළේ, වැලිමඩ සහ කැප්පෙටිපොල ප්‍රාදේශීය අධිකාරී ප්‍රදේශයේ කොට්ඨාස ලේකම් කාර්යාලය තුළ පිහිටි ගවරම්මාන ගමෙහි වූ ගවරම්මාන අංක 49 ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසය තුළ පිහිටි නිලල්ලේවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක එස්. පී. රත්නායක විසින් සාදන ලද 2008.08.18 දිනැති අංක 3533/A දරන පිඹුරෙහි ලොට් 1B ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස එකී අංක 3533/A දරන පිඹුර ප්‍රකාරව උතුරට : වැවෙන් ද, නැගෙනහිරට : ලොට් 1C වලින් ද, දකුණට : ඉහත කී පිඹුරේ ලොට් 2B වලින් ද සහ බටහිරට : කඳුර හෙවත් වඩාත් නිවැරදි ලෙස ඇලෙන් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් පර්චස් විසි හතයි දශම එක (අ. 0, රූ. 0, පර්. 27.1) ක් වන අතර එකී අංක 3533/A දරන පිඹුර ප්‍රකාරව එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් ඇතුළු සියළු දේද සමග වේ.

(ආ) ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ උඩපළාත කෝරළේ, වැලිමඩ සහ කැප්පෙටිපොල ප්‍රාදේශීය අධිකාරී ප්‍රදේශයේ කොට්ඨාස ලේකම් කාර්යාලය තුළ පිහිටි ගවරම්මාන ගමෙහි වූ ගවරම්මාන අංක 49 ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසය තුළ පිහිටි නිලල්ලේවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක එස්. පී. රත්නායක විසින් 2008.08.18 දින සාදන ලද අංක 3533/A දරන පිඹුරෙහි ලොට් 1C ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස එකී අංක 3533/A දරන පිඹුර ප්‍රකාරව උතුරට : අයි. එම්. එම්. ගුණතිලක සහ වෙනත් අයට අයත්යැයි කියනු ලබන ඉඩමෙන් ද, නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාරෙන් ද, දකුණට : ඉහත කී පිඹුරෙහි ලොට් 2C වලින් ද, බටහිරට : ලොට් 2B සහ ලොට් 1B වලින් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් විසි දෙකයි දශම තුන (අ. 02, රූ. 01, පර්. 22.3) ක් වන අතර එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාවන් ඇතුළු සියළු දේ ද සමග වේ.

3. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ උඩපළාත කෝරළේ, වැලිමඩ සහ කැප්පෙටිපොල ප්‍රාදේශීය අධිකාරී ප්‍රදේශයේ කොට්ඨාස ලේකම් කාර්යාලය තුළ පිහිටි ගවරම්මාන ගමෙහි වූ ගවරම්මාන අංක 49 ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසය තුළ පිහිටි නිලල්ලේවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක එස්. පී. රත්නායක විසින් 2008.08.18 දින සාදන ලද අංක 3533/A දරන පිඹුරෙහි ලොට් 1A ලෙස ලකුණු කර ඇති ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස එකී අංක 3533/A දරන පිඹුර ප්‍රකාරව උතුරට : රජයේ ඉඩමෙන් ද, නැගෙනහිරට : කඳුරෙන් ද, දකුණට : ඉහත කී පිඹුරේ ලොට් 2A වලින් ද සහ බටහිරට : ප්‍රාදේශීය සභා පාරෙන් ද මායිම් යන අතර ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම තුන (අ. 0, රූ. 0, පර්. 16.3) ක් වන අතර එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් ඇතුළු සියළු දේ ද සමග වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N15/08 හි ලියාපදිංචි වී ඇත.

*දෙවන කොටස :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, උඩපළාතේ ගඟ ඉහළ කෝරළේ, දේශීය අධිකාරී ප්‍රදේශය තුළ වූ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇත්ගාල උතුරු ග්‍රාමසේවා කොට්ඨාස අංක 1073 තුළ වූ සිංහපුර ඇත්ගාල ගම පිහිටි මරියවත්ත එස්ටේට් හි ඇත්ගාල කොට්ඨාසය යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ඩී. එම්. පී. බී. රඹුක්වැල්ල විසින් සාදන ලද 2013.09.28 දිනැති අංක 4218 දරන පිඹුරෙහි ලොට් A ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස් එකී අංක 4218 දරන පිඹුර ප්‍රකාරව උතුරු-නැගෙනහිරට : අංක 2748 දරන පිඹුරෙහි ලොට් 6න් ද, දකුණු-නැගෙනහිරට : එම

ඉඩමේ ඉතිරි කොටසෙන් ද, දකුණු-බටහිරට සහ බටහිරට : පිඹුරු අංක 2758හි ලොට් 10 ලෙස ලකුණු කර ඇති පාරෙන් ද සහ උතුරු-බටහිරට : ප්‍රධාන පාරේ සහ නිවෙස් වල සිට ගඟ වෙත දිවෙන පාරෙන් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් පර්චස් විසි හතයි දශම එකයි හත (අ. 0. රූ. 0, පර්. 27.17) හෝ හෙක්ටයාර් 0.06875ක් වන අතර එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් ඇතුළු සියළු දේද සමග සහ විදුලිය සැපයීමේ උපකරණ, ජලය සැපයීමේ උපකරණ සහ විදුලි සංදේශ උපකරණ සමඟ වේ.

තුන්වන කොටස :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, උඩපළාතේ ගඟ ඉහළ කෝරළේ, දේශීය අධිකාරි ප්‍රදේශය තුළ වූ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්පොළ බටහිර ග්‍රාමසේවා කොට්ඨාස අංක 1111 දරන ගම්පොල නගර සභා සීමාව තුළ වූ දුම්රිය පාරේ පිහිටි වරිපනම් අංක 47 දරන ඉඩමේ බලයලත් මානක එස්. එම්. අබේරත්න විසින් සාදන ලද 1990 අප්‍රේල් මස 27 වැනි දිනැති අංක 242 දරන පිඹුරෙහි ලොට් 14A ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස උතුරට : දුම්රිය මාර්ගය වෙන් කරනු ලබන දුම්රිය මාර්ගයක් සඳහා වෙන් කර ඇති ඉඩමෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 242හි ලොට් 15 ලෙස දක්වා ඇති වරිපනම් අංක 45 න් ද, දකුණට, නැගෙනහිරට : පිඹුරු අංක 242හි ලොට් 15 ලෙස දක්වා ඇති වරිපනම් අංක 45න් ද සහ බටහිරට : පිඹුරු අංක 242හි ලොට් 14 ලෙස දක්වා ඇති වරිපනම් අංක 49න් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම අටයි පහ (අ. 0, රූ. 0, පර්. 1.85) ක් වන අතර මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E02/114 හි ලියාපදිංචි වී ඇත.

මෑතක දී කරන ලද මැනුමකට අනුව ඉහත කී දේපළ පහත සඳහන් ආකාරයෙන් විස්තර කළ හැකිය :-

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොළ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, උඩපළාතේ ගඟ පහළ කෝරළේ දේශීය අධිකාරි ප්‍රදේශය තුළ වූ ගම්පොල ග්‍රාම සේවා කොට්ඨාස අංක 1111 දරන ගම්පොල නගර සභා සීමාව තුළ වූ දුම්රිය පාරේ පිහිටි වරිපනම් අංක 47 දරන ඉඩමේ බලයලත් මානක පී. ආර්. එන්. ශ්‍යාමලී රත්නායක විසින් සාදන ලද 2013.06.08 දිනැති අංක 1112 දරන පිඹුරෙහි ලොට් 01 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස උතුරට : දුම්රිය මාර්ගය වෙන් කරනු ලබන දුම්රිය මාර්ගයක් සඳහා වෙන් කර ඇති ඉඩමෙන් ද, නැගෙනහිරට : බලයලත් මානක එස්. එම්. අබේරත්නගේ පිඹුරු අංක 242හි ලොට් 15 ලෙස දක්වා ඇති වරිපනම් අංක 45න් ද, දකුණට : බලයලත් මානක එස්. එම්. අබේරත්නගේ පිඹුරු අංක 242හි ලොට් 15 ලෙස දක්වා ඇති වරිපනම් අංක 45න් ද සහ බටහිරට : බලයලත් මානක එස්. එම්. අබේරත්නගේ පිඹුරු අංක 242හි ලොට් 14 ලෙස දක්වා ඇති වරිපනම් අංක 49න් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් එකී අංක 1112 දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකයි දශම අටයි පහ (අ. 0, රූ. 0, ප. 1.85) හෝ හෙක්ටයාර් 0.00468ක් වේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

04-101/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2015**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| අප්‍රේල් | 2015.04.02 | බ්‍රහස්පතින්දා | 2015.03.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.10 | සිකුරාදා | 2015.03.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.17 | සිකුරාදා | 2015.04.02 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.04.24 | සිකුරාදා | 2015.04.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.30 | බ්‍රහස්පතින්දා | 2015.04.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2015.05.08 | සිකුරාදා | 2015.04.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.05.15 | සිකුරාදා | 2015.04.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.05.22 | සිකුරාදා | 2015.05.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.05.29 | සිකුරාදා | 2015.05.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2015.06.05 | සිකුරාදා | 2015.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.12 | සිකුරාදා | 2015.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.19 | සිකුරාදා | 2015.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.26 | සිකුරාදා | 2015.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.